# ඡන්දය ප්‍රකාශ කිරීමට කිතුනු මඟ පෙන්වීමක් තිබේද?

2019 නොවැම්බර් 16 වන දින ජනාධිපතිවරණයේදී *ඡන්දය දිය යුත්තේ කාටද* යන්න මෙම ලිපියෙන් සාකච්ඡා නොකරන නමුත්, ජනාධිපතිවරයෙකු තෝරා ගැනීමේදි අපට උපකාරී වන කිතුනු සාරධර්ම හා මූලධර්ම ගැන විමසා බැලේ.

## *අප අපේ ඡන්දය භාවිතා කළ යුතුද?*

පළමුව, කිතුනුවන් ඡන්දය ප්‍රකාශ කිරීම "ලෝකයේ" කාරණයක් ලෙස හෝ දේශපාලනය අප ගැන තැකීමක් නොකරන බව හෝ නොසිතිය යුතුය. දෙවියන්වහන්සේ පාලකයන් හා ඔවුන්ගේ වගකීම් ගැන පමණක් නොව, රටේ පැවැත්ම උදෙසා අපේම පෞද්ගලික සහභාගීත්වය ගැන ද සැලකිලිමත් වන බව බයිබලයේ පිටු අතර, විශේෂයෙන් පැරණි ගිවිසුමේ සඳහන් වේ. ක්‍රියා 6 හි උපස්ථායකයන් තෝරා ගැනීම හැරුණු විට ඡන්දය ප්‍රකාශ කිරීමක් බයිබලයේ සඳහන් නොවූවද, යෙරෙ 29:7 හි දී අපෙන් ඉල්ලා සිටින්නේ "මා විසින් නුඹලා දාසකමට ගෙන ගියාවූ නුවරේ සමාදානය සොයා එය උදෙසා ස්වාමින්වහන්සේට යාච්ඤාකරපල්ලා. මක්නිසාද එහි සමාදානයෙන් නුඹලාට සමාදානය ලැබෙයි." යන්නයි. එබැවින්, අප මේ ලෝකයේ 'විප්‍රවාසි' අය ලෙස සිතුවද (එක් අර්ථයකින් අප එසේ වූවද), එහි සුභසාධනය සෙවිය යුතුය. මේ සම්බන්ධයෙන් අපට කළ හැකි අවම දෙය නම්, ඡන්දය භාවිතා කිරීමයි.

මේ වතාවේදි, අපේ ඡන්දය නරක් කිරීම රටේ සුභසාධනය සෙවීමේ වලංගු ක්‍රමයක් විය හැකිද යන්න අපට ඇති සමාන්තර ප්‍රශ්නයකි. හිතාමතාම ඡන්දය නරක් කිරීමෙන් කිසිම අපේක්ෂකයකු ගැන අප සතුටු නොවන බව ඔවුන්ට දැන්විය හැක. මෙය ඡන්දය ප්‍රකාශ නොකර සිටීමට වඩා සුළු වශයෙන් හෝ යහපත් විය හැක. කෙසේ වෙතත්, අප අවට ලෝකය සිහි බුද්ධිය ඇතිව අවබෝධ කර ගන්නවා යනු එහි වැටුන ස්වභාවය හඳුනා ගැනීමයි. සභාව වුව (සමහරු විශේෂයෙන් යයි පවසයි) පරිපූර්ණ නොවන බව බයිබලය පිළිගන්නා අතර පරණ ගිවිසුමේ නායකයන්ද එසේ නොවූහ. ඒ අනුව වඩාත් හොඳ පුද්ගලයෙකුට අපේ ඡන්දය භාවිතා කිරීම වඩාත් ඵලදායි වේ.

## *අපි හොඳම අපේක්ෂකයාට ඡන්දය දිය යුතුද? එසේ නොමැතිනම් නරකම පුද්ගලයා ඉවත් කළ යුතුද?*

අතීතයේ දී බොහෝ විට බොහෝ ශ්‍රී ලාංකිකයන් මේ ආකාරයේ තේරීමකට මුහුණ දී ඇති අතර සමහර විට මෙවරද එය එසේ විය හැක. හොඳම අපේක්ෂකයාට ජයග්‍රහණය කිරීමට ඇති අවස්ථාව වඩාත් අඩු විය හැකි අතර, එවැනි පුද්ගලයෙකුට ඡන්දය ප්‍රකාශ කිරීමෙන් නරකම අපේක්ෂකයා තේරී පත්වීමේ අවස්ථාව පුළුල් වනු ඇත. මෙය කෙනෙකුගේ ප්‍රතිරූපය නරක් කළ යුතුද නැද්ද යන්න පිළිබඳව උභතෝකෝටික පැනයකි. හැකි හොඳම අපේක්ෂකයාට ඡන්දය දීමේ විකල්පය (එම පුද්ගලයා ජයග්‍රහණය නොකළද) රටේ දිගුකාලීන දේශපාලන අනාගතය සඳහා කෙරෙන ආයෝජනයකි. බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී රටවල ප්‍රධාන පක්ෂ දෙකක් ආධිපත්‍යය දරන අතර, ඔවුන් බොහෝ විට එකිනෙකා සමඟ විවිධ කාරණා සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණේ - වැරදිකරුවන්ට දඬුවම් කිරීම හෝ නොකිරිම ඇතුළුව. එවැනි පක්ෂ ආධිපත්‍යය බිඳ දැමීම කිතුනුවන්ට අනුමත කළ හැකි දෙයක් විය හැක. නිදසුනක් ලෙස, ඉම්රාන් ඛාන්ගේ පාකිස්තාන ටෙහ්රික්-ඊ-ඉන්සාෆ් (පීටීඅයි; පකිස්තාන යුක්තිය සඳහා වූ ව්‍යාපාරය) පක්ෂයට 2018 දී වැඩිම ආසන සංඛ්‍යාවක් ලැබීමට පෙර 1996 සිට දීර්ඝ කාලයක් බලා සිටීමට සිදුවිය. කිතුනුවන්, එලෙස හොඳම දේ සඳහා ඡන්දය දීම ආලෝකය සේ හැසිරීමක් වන අතර

(එනම්, දිගු කාලීන වෙනසක් දැකීමට බලාපොරොත්තුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම) නරකම දේ වළක්වා ගැනීම සඳහා ඡන්දය දීම ලුණු මෙන් කටයුතු කිරීමක් ලෙස (නැවත වෙනස් කළ නොහැකි විනාශයන් හා හානියන් වැළැක්වීම සඳහා ප්‍රතිගාමී පියවරක් ලෙස ඡන්දය භාවිතා කිරීම) එනම් යේසුස්වහන්සේගේ ලුණු සහ ආලෝකය රූපකයේ (මතෙව් 5:13-16) සංදර්භයට අනුව ක්‍රියා කිරීමක් සේ හඳුනා ගත හැක.

## *අපේක්ෂකයා කිතුනු සභාවට පක්ෂව හෝ දුප්පතුන්ට ගැති විය යුතුද?*

කිතුනු සභාව තම අභිමතාර්ථයන් සෙවීමට පෙර අන් අයව රැකබලා ගන්නා ආයතනයක්ය යන අදහස බයිබලයේ සමස්ත කාලපරිච්ඡේදය තුළම සඳහන් වේ. දෙවියන් වහන්සේ "දුප්පතුන්ට පක්ෂග්‍රාහී" බව ඩේවිඩ් ෂෙපර්ඩ් ලියා ඇත. එබැවින් අපේ සමාජයේ පහළම කොටස් වෙත දක්වන සැලකිල්ල අප ඡන්දය දිය යුත්තේ කාටද යන්න තීරණය කිරීමේ වැදගත් නිර්ණායකයකි. "ඔහු අසරණයාගේද දිළින්දාගේද නඩුව ඇසුවේය; එවිට ශුභසිද්ධවුයේය. මා ඇඳිනගැනීම නම් ඒක නොවේදැයි ස්වාමින්වහන්සේ කියනසේක." (යෙරෙ. 22:16) එය යොෂියා නම් වූ යහපත් රජතුමා පිළිබඳ විස්තරයකි. කෙසේ වෙතත්, මේ දිනවල සෑම අපේක්ෂකයෙකුම පාහේ දුප්පතුන්ට පක්ෂපාතී වන බවට ප්‍රතිඥා දෙයි. එබැවින්, බොහෝ විට සාපේක්ෂව දුර්වල හා අගහිඟකම් ඇති පීඩිත සුළුතර ප්‍රජාවන්ගෙන් ලැබෙන සහයෝගය මත අපේක්ෂකයින් අතර තේරීමක් කිරීමට පහසු විය හැකිය. දාර්ශනික කාල් පොපර්ගේ වචනවලින් මෙය තවත් ආකාරයකින් ප්‍රකාශ කළහොත්, "බොහෝ දෙනකුට ලබා ගත හැකි ලොකුම සතුට වෙනුවට සැමට වළකා ගත හැකි අවම දුක් වේදනා" සෙවීමයි.

නිතර නිතර ආගමික නායකයින් මුණගැසෙමින් හෝ ආගමික රැස්වීම් ස්ථානවලට පැමිණෙමින් එම දර්ශන රූපවාහිනියේ විකාශනය කරමින් ලබා දෙන ප්‍රචාරය නවතාලීමද මේ හා බැඳෙන කාරණයකි. මැතිවරණයක් පැවැත්වෙන විට හෝ ධුරයේ සිටියදී හෝ නායකයින් විසින් ප්‍රදර්ශනය කරනු ලබන ජනප්‍රිය ආගම්වාදය, ඔවුන් ලබා දීමට උත්සාහ කරන යුක්තිය හා ප්‍රතිලෝම ලෙස සමානුපාතික බව මට පෙනේ. පරණ ගිවිසුමේ අනාගතවක්තෘවරයෙකුගේ වචන දෙවියන් වහන්සේගේ හැඟීම් ප්‍රකාශ කරමින් බයිබලය ද එය ඉතා දීප්තිමත් ලෙස සඳහන් කරයි: "නුඹලාගේ මංගල්‍යවලට ද්වේෂකර ඒවා සුළුකොට සිතමි. නුඹලාගේ මංගල්‍ය රැස්වීම්වලටද මම ප්‍රසන්න නොවෙමි. නුඹලාගේ දවන පූජාද නුඹලාගේ ආහාර පූජාද මට ඔප්පුකරන නමුත් ඒවා පිළි නොගන්නෙමි. නුඹලාගේ තර සතුන්ගෙන් ඔප්පු කරන ශාන්ති පූජාවන්ද නොසලකන්නෙමි. නුඹේ ගීතිකා ඝෝෂාව මා වෙතින් අහක්කරගනින්න; නුඹේ වීණා නාදයත් නාසන්නෙමි. නමුත් යුක්තිය ජලය මෙන් ද ධර්මිෂ්ඨකම බලවත් දිය පහරක් මෙන් ද ගලායාවා." (ආමොස් 5:21-24).

## *අපේක්ෂකයින්ගේ වාර්තාව අප විනිශ්චය කරන්නේ කෙසේද?*

සලකා බැලිය යුතු සාධක ගණනාවක් ඇති හෙයින් ධාවන පථ වාර්ථාවක් විනිශ්චය කිරීම තරමක් අපහසුයි, මන්ද මීට පෙර මේ හා සමාන තනතුරක් නොතිබූ (හෝ මීට පෙර බලයේ සිටියදී කටයුතු කළ ආකාරය අමතක වී ඇති) තරඟකරුවෙකුට වඩා මෑතක බලයේ සිටි  අපේක්ෂකයකුගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අපගේ මතකය නැවුම්ය. ධනාත්මක හා ඍණාත්මක සාක්ෂි මත පදනම්ව විනිශ්චය කළ යුතුද යන්න තීරණය කිරීමේ දුෂ්කරතාවයක් ද ඇත. ද්විතීය කථාව 17:14-20 හිදී යහපත් රජෙකුගේ නිර්ණායක ගැන කතා කරන විට, එය ඍණාත්මක ("ඔහු තමාගේ අශ්වයන්, භාර්යාවන්... රිදී සහ රත්තරන් වැඩි නොකළ යුතුය") සහ ධනාත්මක කරුණු ("මෙම නීතියේ සහ මෙම ප්‍රතිපත්තිවල සියලු වචන පිළිපැදීමෙන් හා ඒවා කිරීමෙන් තම දෙවි සමිඳාණන් වහන්සේට ගරුබිය දැක්වීමට ඉගෙන ගන්න") යන

අංශ දෙකම ආවරණය කරයි. එබැවින් ප්‍රධාන නිෂේධාත්මක නිර්ණායකය වන්නේ පාලකයා ධනය හා බලය රැස් කර ගෙන දුප්පතුන් තවත් දුප්පත් කර තිබේද යන්නයි. ප්‍රධාන ධනාත්මක නිර්ණායකය වන්නේ පාලකයා නීතියට අවනතද යන්නයි (ද්විතීය කථා සන්දර්භය අපට වඩා තරමක් වෙනස් වුවද ඒ හා සමානකම්ද ඇත). තමා නීතියට ඉහළින් සිටීමට හෝ එය හැසිරවීමට උත්සාහ නොකළ යුතුයි, බොහෝ පාලකයින් කාලයත් සමඟ එසේ කිරීමට පෙළඹේ. මෙවන් සන්දර්භයක් තුළ, ස්වාධීන අධිකරණයක් ආරක්ෂා කිරීම සඳහා වූ වාර්තාව ඉතා වැදගත් නිර්ණායකයකි. එසේම, මැතිවරණ ව්‍යාපාරයේදී අපේක්ෂකයින්ගේ හැසිරීම, මැතිවරණ නීතිවලට අනුකූලව කටයුතු කිරීම සහ සීමාව නොඉක්මවා වියදම් කිරීම වැනි කරුණු ඔවුන් විනිශ්චය කිරීමට යොදා ගත හැකිය.

## *ස්ථාවරත්වය, යහපාලනය සහ ජාතික ආරක්ෂාව අතරින් අපේ තේරීම කරන්නේ කෙසේද?*

බොහෝ දෙනා විසින් 2015 ජනාධිපතිවරණය නිරූපණය කරනු ලැබුවේ ස්ථාවරත්වය සහ යහපාලනය අතර තේරීමක් ලෙස ය. එසේ නම්, ක්‍රිස්තියානි දෘෂ්ටි කෝණයෙන් මේ අතරින් කුමක් අනෙකට වඩා සුදුසු වේද? යහපාලනය අතිශයින්ම වැදගත් බව අප ද්විතීය කථාවෙහි දැක ඇත්තෙමු. ස්ථාවරත්වය ගැන කුමක් කිව හැකිද? පාවුල් තිමෝතිගෙන් ඉල්ලා සිටින්නේ "ඉතින් අප විසින් සියලු ආකාර භක්තියෙන් හා සන්සුන්කමින් සමාදනාවූ නිශ්චල ජීවිතයක් ගත කරන පිණිස, රජවරුන් හා උසස් තනතුරු දරන සියල්ලන් ඇතුළුව සියලු මනුෂ්‍යයන් උදෙසා ඉල්ලීම්ද යාච්ඤාද මැදිහත්කම්ද ස්තුති දීම්ද පවත්වන්ට සියල්ලන්ට පළමුවෙන් අවවාද කරමි" (1 තිමෝති 2:1-2). බැලූ බැල්මට මෙය ස්ථාවර සමාජයක් අනුමත කරන බව පෙනේ. කෙසේ වෙතත්, පරණ හා අළුත් ගිවිසුමේ මානව ක්‍රියාකාරකම් අතරින් වඩාත් සැලකිලිමත් වන්නේ යුක්තිය උදෙසා කටයුතු කිරීමය. ස්ථාවර පාලන තන්ත්‍රයන් බොහෝ විට අයුක්තියෙන් සංලක්ෂිත වේ. සලමොන්ගේ පාලනය ඊශ්‍රායෙල් ඉතිහාසයේ වඩාත්ම ස්ථාවර කාලය විය හැකිය - ආර්ථිකය කොතරම් යහපත්ද යත් රිදීවල වටිනාකම නැති වී ගියේය. රත්‍රං වටිනාකමක් ඇති එකම ලෝහය විය (1 රාජාවලිය 10:21). එහෙත් සාලමොන් අයුක්ති සහගත ලෙස බදු අය කර එක්රැස් කර ගත් ධනයෙන් ඔහුගේ අගනගරය අලංකාර කළේය. එහි ප්‍රතිඵලය වූයේ ඔහුගේ මරණයෙන් පසුව ඊශ්‍රායෙලය දෙකට බෙදීමයි. මන්දයත් එවැනි බදු ගෙවීමකට පිටස්තර ගෝත්‍රිකයන් කැමති නොවූ නිසාය (1 රාජාවලිය 12). බොහෝ විට ස්ථායිතාවයට ව්‍යුහාත්මක අයුක්තිය වසන් කළ හැකිය; විශේෂයෙන්ම අපගෙන් සමහරෙකු එම අයුක්තියෙන් ප්‍රයෝජන ලබා ගත හැකි නිසා, ඊට පක්ෂව කථා කිරීමේදී අප අතිශයින්ම ප්‍රවේසම් විය යුතුය.

මෙම ස්ථායිතාව සහ යහපාලනයට අමතරව ජාතික ආරක්ෂාව ඒ තුළට ඇද දමා ඇති  අතර, එය අද ලොව පුරා බොහෝ රටවල් වලට වැදගත් වී ඇති බව පෙනේ. පරම්පරාවකට හෝ ඊට පෙර, ජාතික ආරක්ෂාව යන්නෙන් අදහස් කළේ විදේශ සතුරු රටකින් එල්ල වූ බාහිර තර්ජනවලට මුහුණ දීමයි, එහෙත් අද දින අවාසනාවකට මෙන් එය අභ්‍යන්තර තර්ජන සම්බන්ධයෙන් වැඩි අර්ථයක් ලැබී ඇත. එනම් රට තුළ සිටින පුරවැසි කණ්ඩායම් වලින් එල්ල වන තර්ජන. මෙය වර්තමාන බහු සංස්කෘතික සමාජවල යථාර්ථයක් විය හැක. කෙසේ වෙතත්, අභ්‍යන්තර තර්ජන දෙයාකාරයකින් විසඳා ගත හැකිය - එක් ක්‍රමයක් වන්නේ ආරක්ෂක තත්වය හා පරීක්ෂණ ප්‍රමාණයන් වැඩි කිරීමයි; එහෙත් තවත් ක්‍රමයක් වන්නේ පොදු පදනමක් ඇති කර ගැනීම සඳහා විවිධ පුරවැසියන් අතර වැඩි විශ්වාසයක් හා සමගිය ගොඩනැගීමයි. මින් කුමන පවේශය බයිබලානුකූල මූලධර්මයන්ට වඩා අනුකූලද යන්න සහ කුමන අපේක්ෂකයින් කවරක් ප්‍රවර්ධනය කරන්නේද යන්න තීරණය කිරීමට පුද්ගලයන්ට පුළුවන.

## *සමහර අනතුරු ඇඟවීම් සහ යෝජනා*

එළඹෙන ජනාධිපතිවරණයේදී අපට ඇති තේරීම සම්බන්ධයෙන් ක්‍රිස්තියානි මතයක් ඉදිරිපත් කිරීමට හැකි තරම් මම උත්සාහ කර ඇත්තෙමි. මෙහිදී ශුද්ධ ලියවිලි පද කිහිපයක් භාවිතා කර ඇතත්, බයිබලානුකූල ලෝක දෘෂ්ටියක් සොයා ගැනීමට වඩා හොඳ ක්‍රමය නම් සමස්තයක් වශයෙන් බයිබලයේ මගපෙන්වීම වටහා ගැනීමයි. මම එය කිරීමට වෙහෙසුනෙමි. කෙසේ වෙතත්, අප මුහුණ දෙන සියලු කාරණා ගැන බයිබලය ඍජු ලෙස කථා නොකරයි. එලෙසින්ම අප සියල්ලන්ටම අපේම පක්ෂග්‍රාහී බවක් ඇති අතර, මෙම ලිපියෙන්ද එය පැහැදිලි විය හැකිය. ශුද්ධ ලියවිලි පද අර්ථ නිරූපණය කිරීමේදී පක්ෂග්‍රාහී බවින් ජය ගැනීමට නම්, එම අදාල කිරීම් කිතුනු ප්‍රජාව තුළ සාකච්ඡා කළ යුතුයි. එම සාකච්ඡා තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ අපට මඟ පෙන්වනු ඇත. අපගේ ඡන්දය පුද්ගලික බවත් අප තෝරා ගන්නා ආකාරය හා එය ක්‍රියාත්මක කිරීමට අපට නිදහස ඇති බවත් සත්‍යයකි. කෙසේ වෙතත්, සෑම පැත්තකින්ම පණිවුඩ හා ප්‍රචාරයන් අප වෙත එල්ල වේ, අප ශුද්ධ ලියවිලිවලට සවන් දිය යුතු අතර අපගේ ක්‍රිස්ස්තියානි ප්‍රජාවන් තුළ මෙම කරුණු සාකච්ඡා කළ යුතුය. එවිට ඡන්දය දිය යුත්තේ කාටද යන්න පිළිබඳව අප විශ්වාසදායි ක්‍රිස්තියානි මතයකට අපට ළඟා විය හැක. අපට එකඟතාවකට නොපැමිණිය හැකි නමුත්, අද දවසට උචිත අයුරින් අර්ථකථනය කිරීමේ අරමුණින් දේව වචනය තුළින් හා ක්‍රිස්තියානි ප්‍රජාව මඟින් කථා කරන දෙවියන්වහන්සේ ගේ හඬට අප හොඳින් සවන් දිය යුතුය.

කිතුනුවන්ට කළ හැකි අනෙක් දෙය නම්, මෙම ජනාධිපතිවරණයේදි දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු වීම පිණිස තනි තනිවත් සාමූහික ලෙසත් යාච්ඤා කිරීමයි. බොහෝ මිනිසුන් ලෝකය හා දෙවියන්වහන්සේගේ ආශ්චර්යමත් මැදිහත්වීම සොබාදහමේ නීති අත්හිටුවීම හෝ අවලංගු කිරීම සමඟ සම්බන්ධ කරති. කෙසේ වෙතත්, ඉතිහාසයේ දෙවියන්වහන්සේ ලෙස උන්වහන්සේ මිනිස් කටයුතු හා බැඳී සිටීම ශුද්ධ ලියවිල්ල පුරාම වඩාත් ප්‍රචලිතය. අප ජාතිය වෙනුවෙන් යාච්ඤා කිරීමේදිම එම සත්‍යය අපව දිරිමත් කළ යුතුය.

ප්‍රියාන් ඩයස්

2019 ඔක්තෝබ්ර